සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

84

## අ.පො.ස. (සා.පෙළ) විභාගයට අදාළ පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2022

## ශිල්ප කලා

කාලය පැය -03

නම:-........................................................................................ විභාග අංකය:-..........................................................................

පාසල-........................................................................................

අමතර කියවීම් කාලය ,ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් , පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛතාවය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**84 - ශිල්ප කලා -I**

සැලකිය යුතුයි

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4, යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.

1)අතීතයේ සිට පැවත එන්නා වූ සිව් සැට කලාව ප්‍රධාන වශයෙන් ප්‍රභේද දෙකකට වෙන් කර තිබේ . එම කලාවන් හඳුන්වන්නේ,

1.මූර්ති කලාව,වන්නම් 2. විදග්ධ කලාව,ජන කලාව

3.ශ්‍රව්‍ය කලාව ,දෘශ්‍ය කලාව 4.ශ්‍රව්‍ය කලා,චිත්‍ර කලා

2).මිනිසාගේ සිතුම් පැතුම් අවශ්‍යතා මුල්කරගෙන ජන කලා බිහිවී ඇත.පහත දැක්වෙන ජන කලා අතුරින් දෘශ්‍ය කලා ලෙස සැලකෙන ජන කලා කාණ්ඩය තෝරන්න.

1.පැල් කවි ,ගොයම් කවි, මැටි කර්මාන්තය 2.වෙස් මුහුණු ,කරත්ත ,පාරු කර්මාන්ත

3.පේෂ කර්මාන්තය ,පතල් කර්මාන්තය, කෘෂිකර්මාන්තය 4.ලාක්ෂා, පිත්තල ,ලී කැටයම් කලාව

3).දුම්බර පැදුරු විවීම සඳහා යොදාගන්නා ශාකය කුමක්ද?

1.මැනිලා 2.ජුට් 3.නියද 4.හණ

4).අඳුරු කිරීමේ රේඛා, දීර්ඝ කිරීමේ රේඛා, මිනුම් රේඛා සඳහා භාවිත කරන රේඛා වර්ගය හඳුන්වන නාමය වන්නේ,

1.සිහින් අඛණ්ඩ රේඛා 2.සිහින්දාම රේඛා

3.ඝන අඛණ්ඩ රේඛා 4.දෙකෙළවර ඝන දාම රේඛා

5).නිල් හා රතු වර්ණය මිශ්‍රකර සාදා ගත හැකි වර්ණය කුමක්ද

1.කොළ වර්ණය 2.දම් වර්ණය 3.තැඹිලි වර්ණය 4.කළු වර්ණය

6).සියුම් ඉරි ,ඉම් රේඛා ,තිත ආදිය ඇඳීමට සුදුසු පින්සල් වර්ගය කුමක්ද?

1.නො.4-9 2.නො.00-03 3.නො.2-3 4.නො.01-02

7).නූල්වලට කැද දැමීමෙන් බලාපොරොත්තු වන්නේ,

1.නූල් වලට ශක්තිය ලබා දීම 2. සායම් දැමීම පහසු කරවීම

3.නූල් වල අපද්‍රව්‍ය ඉවත් කිරීම 4.නූල් සුදු පැහැ ගැන්වීම

8).පරිසර සම්පත් වලින් සුදු වර්ණය ලබා ගැනීම සඳහා යොදා ගන්නා ලද්දේ,

1.ගොකටු ගසේ කිරි 2.මකුළුමැටි 3.නිල් අවරිය 4.සාදිලිංගම්

9).රෙදි මුද්‍රණයට පෙර මල හරණයට ලක්කිරීම තුළින් බලාපොරොත්තු වන කාර්යය කුමක්ද?

1..සායම් තැවරීම ය 2.සායම් ආලේපනය

3.සායම් වන අවශෝෂණය ශක්තිය 4.අපද්‍රව්‍ය ඉවත් කිරීම

10).රෙදිපිළි අලංකරණයේදී සායම් පෙවීම යටතේ භාවිත වන අලංකරණ කාණ්ඩය තෝරන්න.

1.පින්තාරු කිරීම ,එම්බෝස් කිරීම 2.ගැට පඩු කිරීම,බතික් කිරීම

3.තිර රාමු මුද්‍රණය, තහඩු මුද්‍රණය 4.සායම් ඉසීම ,සායම් ගැල්වීම

11).පටපණු කෝෂ වලින් ලබා ගන්නා කෙඳි භාවිතා කර සකස් කරගන්නා නූල් හඳුන්වන නාමය වන්නේ ,

1.කපු නූල් 2.සේද නූල් ය 3.ලිනන් නූල් ය 4.ග්‍රාස් ලිනන් නූල් ය

12).ප්‍රධාන වියමන් රටා සහිත පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1.වාම් ,හිරි ,ජටාය 2.වාම්, හිරි, සැටින් ය 3.වාම්, ජටා ,දික් දාරය 4.ජටා, දික් දාර ,හරස් දාරය

13).ප්‍රාථමික මැටි භාවිතයෙන් කරන නිෂ්පාදනයකි.

1.රතු මැටි භාණ්ඩ සෑදීම 2.දන්තාලේප සෑදීම

3.උළු සෑදීම 4.ගඩොල් සෑදීම

14).මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී දියර වාත්තු ක්‍රමය ලෙස හඳුන්වනු ලබන්නේ

1.පදම් කල මැටි ගෙන අතින් භාණ්ඩ නිෂ්පාදනයයි

2.අච්චු තුළට මැටි දියර වත්කර භාණ්ඩ නිෂ්පාදනය

3.අච්චුවලට ප්ලාස්ටර් පැරිස් වත්කර භාණ්ඩ නිෂ්පාදනය

4.අච්චු තුළට grog යොදා භාණ්ඩ නිෂ්පාදනය

15).මැටි භාණ්ඩ සෑදීමේදී සච්ඡිද්‍රතා ගුණය අඩු මැටි සඳහා පුළුස්සන ලද භාණ්ඩවල කුඩු භාවිත කරයි.එම කුඩු වර්ගය හඳුන්වන නම කුමක්ද?

1.ඩොලමයිට් 2.ග්‍රොග් 3.ක්වාට්ස් 4.සිලිකා

16).මහා පරිමාණ කර්මාන්ත ශාලාවල යන්ත්‍රානුසාරයෙන් මැටි පදම් කිරීමේ දී වැඩිපුර ඇති වතුර ඉවත් කිරීමට භාවිත කරන යන්ත්‍රය කුමක්ද?

1.පිල්ටර් ප්‍රෙෂ් 2. බෝල් මිල් 3.ජෝක්‍රෂර් 4.රෝලර් ක්‍රෂර්

17).3cm අරයකින් යුත් වෘත්තයක් ඇඳ එම අරයෙන්ම පරිධිය බෙදීමෙන් ලැබෙන ලක්ෂ යා කිරීමෙන් ඇඳිය හැකි බහු අස්‍රය වන්නේ

1.පංචාස්‍රය 2.අෂ්ඨාස්‍රය 3.නවාස්‍රය 4.ෂඩාස්‍රය

18).ඉංග්‍රීසි ක්‍රමයට අනුව කපු නූල් කැරැල්ලක දිග යාර කීයද?

1.යාර 1000 කි 2.යාර 300 කි 3.යාර 840 කි 4.යාර 560 කි

19).රෙදි කැබලි ආශ්‍රිතව සෙල්ලම් සතුන් නිර්මාණය කිරීමෙන් අපට ලබාගත හැකි වඩාත් හොඳ ප්‍රතිඵලයකි.

1.විවේකය ඵලදායි ලෙස ගත කිරීම 2.ගුරුහරුකම් ලබා දීම

3.ප්‍රදර්ශන සඳහා සහභාගී වීම 4.මනස සැහැල්ලු වීම

20).මෙට්‍රික් අංකය 20 s තනිපොට නූල් 10kg ඇත. නූල් 1kg ඇති කැරලි ගන්න කීයද?

1.කැරලි 6 2.කැරලි 10 3.කැරලි 20 4.කැරලි 40

21).නිර්මාණයේ චමත්කාර බව හා අලංකාරය තීව්‍ර වීමට බලපාන උද්‍යාන විද්‍යා මූලධර්මය කුමක්ද?

1.නිමාව ය. 2.විවිධත්වය ය. 3.ආරම්භය ය. 4.හැඩතලය

22).පේෂ කර්මාන්තයේදී නිෂ්පාදන වේගය වැඩි වර්තමානයේ ද භාවිත වන යන්ත්‍රය වන්නේ ජවනඩා යන්ත්‍රයයි. මෙය නිෂ්පාදනය කරන්න.

1.ජෝන් කේ මහතාය. 2.වාල්ස් බේඩින් මහතාය.

3.වාල්ස් ඩේවිඩ් මහතාය. 4.ඩේවිඩ් පවල් මහතාය.

23).පේපර් ක්විලින් නිර්මාණ සඳහා කඩදාසි සමාන පළලකින් යුතු ව කපාගැනීම ඉතා වැදගත් වේ.මේ සඳහා යොදා ගත හැකි ලේසිම පහසුම ක්‍රමය වන්නේ,

1.සමාන තීරු ඇඳ කතුරෙන් කපා ගැනීම.

2.සමාන තීරු ඇඳ පේපර් කටර් එකෙන් කපාගැනීම.

3.කඩදාසි විරූපණය යන්ත්‍රය මඟින් කපා ගැනීම.

4.සමාන තීරු ඇඳ අතින් ඉරා ගැනීම.

24).බීරළු රේන්ද ඉතා මිල අධික ය. මෙම මිළ අධිකය රේන්ද වර්ග ගෙතීම සඳහා යොදා ගන්නා විශේෂිත උපකරණය වන්නේ,

1.ගෙතුම් කටුව. 2.රේන්ද කටුව. 3.බීරළු රේන්ද කොට්ටය 4.හර්නල් කටුව

25).අයිඩා රෙදි භාවිතයෙන් විසිතුරු නිර්මාණ කිරීමේදී කතිර මැස්ම සඳහා සුදුසු ඉදිකටු වර්ගය කුමක්ද?

1.අයිඩා ඉදිකටු 2.මැෂින් ඉදිකටු 3.අත් ඉදිකටු 4.ටැපෙස්ට්‍රි ඉදිකටු

26).කඩදාසි පල්ප මාධ්‍ය නිර්මාණයක් කිරීමේදී කෘමි සතුන්ගෙන් ආරක්ෂා වීමට භාවිතා කරන්නේ මොනවාද?

1.පොල් තෙල්, කරාබුනැටි තෙල් ය 2.මී තෙල්, පොල් තෙල් ය

3.කරාබුනැටි තෙල්, ලින්සීඩ් ඔයිල් ය 4.තල තෙල්, මී තෙල් ය

27).මැටි තහඩු භාවිතයෙන් කැටයමක් නිර්මාණය කිරීමේදී අඩක් හාරා මතුකර ගන්නා ක්‍රමය හඳුන්වන්නේ,

1.අල්ප උන්නත කැටයම් නමින් 2.සමබර කැටයම් නමින්

3.අධි උන්නත කැටයම් නමින් 4.අර්ධ උන්නත කැටයම් නමින්

28).ඉතා උසස් තත්වයෙන් යුත් කෙඔලින් මැටි නිධි ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත්තේ කිනම් ප්‍රදේශයක ද?

1.මීටියාගොඩ 2.දෙවුන්දර 3.අම්බලන්ගොඩ 4බොරලැස්ගමුව

29).මැටි ජලය සමඟ එක් වීමේදී ඇතිවන ඇලෙන සුළු බව හඳුන්වන්නේ කිනම් නමකින් ද?

1.සුවිකාර්යතාව 2.සනත්වය 3.සවිවරතාව 4.හැකිලීම

30).හණ,නියද ,මැනිලා වැනි කෙඳි ලබා ගන්නේ ශාකයේ කුමන කොටසින්ද?

1.ගෙඩිවලින් 2.කඳ කොටසින් 3.පත්‍රවලින් 4.මුල් වලින්

31).කපු කෙඳි පිලිස්සීමේ පරීක්ෂාවේදී දක්නට ලැබෙන දෙයකි.

1.කහපාට ලොකු ගිනි දළු ඇතිවීම 2.හෙමින් පිළිස්සීම

3.පිහාටු පිලිස්සෙන ගඳ වහනය වීම 4.කුඩා අළු ගුලි සෑදීම

32).සායම් කළ රෙදි පිලිවල සායම් ස්ථිර කිරීම සඳහා කරන පසු පිරියම් ක්‍රමයක් වන්නේ

1. ධූමාලකරණය කිරීමෙන් පසු සේදීම 2.කැඳ දැමීම

3.සෝඩියම් හයිඩ්‍රොසල්ෆයිඩ් යෙදීම 4.කාබනීකරණය කිරීම

33).මැටි හඳුන්වන රසායනික නාමය වන්නේ කුමක්ද ?

1.ඇලුමිනියම් සිලිකේට් 2.ඇලුමිනියම්ඩයොක්සයිඩ් 3.සිලිකන් ඩයොක්සයිඩ් 4.පෙල්ස්පාර්

34). කැබලි රෙදි යම්කිසි රටාවකට ගොනුකොට මැසීමෙන් හෝ ඇලවීමෙන් කරන නිර්මාණය වන්නේ,

1.කට් වර්ක් 2.නෙට් වර්ක් 3.පැච් වර්ක් 4.නූල් වර්ක්

35).කඩදාසි මාධ්‍යයෙන් මල් සකස් කර කල් පවත්වා ගැනීම සඳහා ඉටි ගැල්වීම සිදුකරයි මේ සඳහා සුදුසු ඉටි වර්ගය

1.මී ඉටි 2.තල් ඉටි 3.පැරපින් ඉටි 4.සෙලෝපේන් ඉටි

36).වර්ණ සකස් කිරීමේදී වර්ණයකට කළු පැහැය එක් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ

1.වර්ණය තද පැහැ වීම 2.වර්ණය ලා පැහැවීම

3.වාරණයේ තීව්‍ර භාවය වැඩි වීම 4.වර්ණය තුනී බව වැඩිවීම

37).ඉලිප්සයක නාභිය සොයාගන්නා ආකාරය වන්නේ

1.ඉලිප්සය කේන්ද්‍රය සිට මහා ක්ෂය දෙසට ඡේදනය කිරීම

2. මහා අක්ෂය කෙළවර සිට මහා අක්ෂය දෙසට ඡේදනය කිරීම

3. අක්ෂයේ අඩක දුරක් කවකටුව ට ගෙන සුළු අක්ෂයේ ඕනෑම කෙළවරක් කේන්ද්‍රය කර මහා අක්ෂය දෙපසට ඡේදනය කිරීම

4.මහා අක්ෂයේ සම්පූර්ණ දුර කටුවට ගෙන සුළු අක්ෂයේ කෙළවරක සිටම මහා අක්ෂය දෙපස ඡේදනය කිරීම

38).කාර්මික කටයුතු සඳහා භාවිත කරන රෙදිපිළි ඇස්බැස්ටෝස් වැනි ඛනිජ කෙඳි වලින් නිපද වීමට හේතුව වන්නේ

1.ඇඳීමට පහසු නිසා 2.තද ශීතලට ඔරොත්තු දෙන නිසා

3.ගිනි නොගැනීම නිසා 4.සිනිඳු නිසා

39).මිනිසා විසින් නිපදවනු ලබන කෘතීම රෙදි වර්ගය ඇතුළත් පිළිතුර තෝරන්න .

1.සේද 2.ලෝම 3.විස්කෝස් 4ඇස්බැස්ටෝස්

40).කෙඳි වර්ග අනුව නූල් කැරල්ලක සම්මත දිග විවිධ වේ. රාත්තලකට ලෝම නූල් කැරලි 10ක් අඩංගු වේ නම්,එම නූල් කැරලි වල සම්පූර්ණ දිග වන්නේ

1.300 × 10 = 3000 2.800 × 10 = 8000

3.560 × 10 = 5600 4.450 × 10 = 4500

**84 - ශිල්ප කලා - ||**

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න .**

ස්වදේශීය පාරම්පරික නිෂ්පාදන හා ඒ හරහා ගොඩ නැඟුණු නව අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනාගාරයක් වයඹ ජන කලා කේන්ද්‍රයේදී විවෘත කරන ලදී. ඒ සඳහා සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට ශිල්ප කලා විෂය හදාරන සිසු සිසුවියන්ට අවස්ථාව ලබා දී ඇත.

1. ප්‍රදර්ශනයේදී සිසුන්ට දක්නට ලැබුණු දෘශ්‍ය කලා 02ක් නම් කරන්න
2. ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කල හැකි පන් ආශ්‍රිත නිෂ්පාදන 02ක් නම් කරන්න.
3. පොල්තෙල් පහන දේශීය ද්‍රව්‍ය යොදාගනිමින් සකස් කර තිබුණි.ඒ සඳහා යොදාගත හැකි දේශීය අමු ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
4. නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සුදුසු තේමා පාඨයක් ලියන්න.
5. උත්සවයේ සංවිධායක මණ්ඩලය හඳුනාගැනීම සඳහා සකස් කළ හැකි නිල ලාංඡනයක ආකෘතියක් අඳින්න.
6. උත්සවයෙ කථන පුවරුව අලංකාර කර ගැනීම සඳහා යොදා ගත හැකි ස්වභාවික මල් වර්ග හතරක් නම් කරන්න.
7. ප්‍රදර්ශනය සඳහා පැච්වර්ක් නිර්මාණ ඉදිරිපත් කර තිබුණි. පැච්වර්ක් නිර්මාණයක් සඳහා සුදුසු නිර්මාණයක දළ ආකෘතියක් අඳින්න.
8. රිබන් නිර්මාණ සඳහා යොදා ගන්නා මැහුම් ක්‍රම හතරක් නම් කරන්න.
9. ප්‍රදර්ශනය සඳහා බතික් නිර්මාණ ඉදිරිපත් කර තිබුණි.බතික් නිර්මාණ සඳහා යොදා ගන්නා ඉටි වර්ග දෙක නම් කරන්න.
10. පොල්තෙල් පහන ලග එලා තිබූ පලස නිර්මාණයට වියමන් රටා යොදාගෙන තිබුණි. ඒ සඳහා යොදා ගත හැකි වියමන් දෙකක් ඇඳ නම් කරන්න.

02.මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේදී පොළොවෙන් ලබාගන්නා මැටි පදම් කර භාණ්ඩ නිෂ්පාදනය කරයි.
1. මැටි පදම් කර ගන්නා ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 2)
2. ප්‍රාථමික මැටි හා ද්විතීක මැටි නිර්මාණය වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)
3. මැටි දරණු මගින් භාණ්ඩයක් සකස් කරගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 4)


03.රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේදී සත්ව, ශාක, ඛනිජ, කෘත්‍රිම කෙඳි නිපදවා ගනු ලැබේ.
1.කෙඳි නිෂ්පාදනය සඳහා සඳහා යොදා ගන්නා ශාක වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 2)
2. කෙඳි හඳුනාගැනීමේ පරීක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 4)
3. කෘත්‍රිම රෙදිපිළි ජනප්‍රිය වීමට හේතු පහක් ලියන්න. (ලකුණු4)

04.නිෂ්පාදනය කරන ලද රෙදි පිළි විවිධ ක්‍රම භාවිතයෙන්අලංකාර කර ගනී.
1. සායම් භාවිතයෙන් තොරව කරන රෙදිපිළි අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු2)
2. සාරියක් අලංකාර කරගත හැකි ක්‍රමයක් නම් කර ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් සකස් කරන්න.(ලකුණු 4 4. ස්ටෙන්සිල් (සිදුරු තහඩු) මුද්‍රණය සඳහා සුදුසු නිර්මාණයක් අඳින්න. (ලකුණු 4)

05.විවිධ නිර්මාණ කිරීමේදී ජ්‍යාමිතික හැඩතල බහුලව යොදා ගනී.
1.ඉලිප්සීයඇඳීමට යොදාගන්නා ක්‍රම නම්කරන්න.
2.7cm ක් උස 4cm ක විෂ්කම්භයක් ඇති සිලින්ඩරයේ විකසනය අඳින්න . (ලකුණු 4)
3.බිත්ති සැරසිල්ලක් සඳහා 5cm වෘත්තයක් නිර්මාණය කර එය සමාන කොටස් අටකට බෙදන්න.(ලකුණු4)

06. අත් පිස්නා සඳහා සකස් කරන ලද නූල් හැදයක දළ රූපසටහනක් පහත දැක්වේ.

+ හැදයේ දිග - මීටර් 100
+හැදයේ පළල - සෙන්ටි මීටර් 60
+එක්සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 40
+නූල නොම්මරය 2/40 s
+නූලේ වර්ණය සුදු




1.අත්පිස්නා රෙදි විවීම සඳහා සුදුසු වියමන් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
2.ඉහත නම් කරන ලද වියමන් දෙකෙන් එක් වියමනක් ප්‍රස්තාර ගත කරන්න.(ලකුණු 4)
3.හැදය සඳහා අවශ්‍ය දික් නූල් ප්‍රමාණය සොයන්න. (ලකුණු 4)

07.උද්‍යාන අලංකරණ නිර්මාණ සඳහා වර්තමානයේ විශාල ඉල්ලුමක් පවතී.
1.උද්‍යානවිද්‍යා මූලධර්ම 4ක් නම් කරන්න. (ලකුණු 2)
2.හම් පදම් අවස්ථාවේදී මැටි භාණ්ඩ වලට යෙදිය හැකි අලංකරණ ක්‍රම හතරක් නම් කරන්න.
(ලකුණු 4)
3.උද්‍යානයක් අලංකාරය කිරීමට සුදුසු සත්ව රූපයක් ඇඳ එය නිර්මාණය කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 4)